# ජාතික ශිල්ප සභාව -2010

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ජාතික ශිල්ප සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජාතික ශිල්ප සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ඉතිරි කිරීමේ බැංකු ගිණුමක 2006 නොවැම්බර් 30 දිනට වූ රු. 140,158 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයට ද එසේම ගිණුම් වල දක්වා තිබුණ අතර අදාල පොලිය ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) ශිල්පීය පුහුණු අංශයේ සමාලෝචිත වර්ෂයට අදාලව වියදම් විෂයයන් 5 ක එකතු වටිනාකම වූ රු.155,900 ක් සඳහා උපචිත ප්‍රතිපාදන සලසා නොතිබුණි..

(ඇ) ශිල්පීය පුහුණු අංශය යටතේ ඇති ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන වලට අදාල ඉතිරි කිරීමේ බැංකු ගිණුම් 123ක ශේෂ වටිනාකම් එකතුව රු. 4,685,846 ක් ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඈ) වත්කම් පවරා නොගැනීම හේතුවෙන් ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන වල ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල දක්වා නොතිබුණි.

1.2.2 ගිණුම් නොසැසඳීම්

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ

(අ) ශිල්ප සභාවේ ස්ථාවර වත්කම් ගිණුම්වල දක්වා ඇති ශේෂ හා ස්ථාවර වත්කම් ලේඛන අතර, රු.3,423,902 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) අවසන් ගිණුම් අනුව රක්ෂණ ගාස්තු බලපත්‍ර ගාස්තු හා කාර්යාල උපකරණ අළුත්වැඩියා වල වටිනාකම රු. 69,385 ක් වුවද ගිණුමේ උපලේඛන වල රු. 123,239 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව වෙනස රු. 53,854 කි.

(ඇ) ශිල්පීය පුහුණු අංශයේ ශේෂ පිරික්සුම හා ලෙජර් අනුව රු. 5,228,662 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) උපලේඛනය අනුව ශිල්පීය පුහුණු අංශයේ ණය ශේෂය රු. 258,500 ක් වුව ද පුද්ගල ණය ලෙජර් අනුව ණය ශේෂය රු. 171,000 ක් දක්වා තිබුණි. වෙනස රු. 87,500 කි.

1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදිය | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි (මු.රෙ.) | |
| (i) මු.රෙ. 133 | සභාව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. |
| (ii) මු.රෙ. 135 | වියදම සහතික කරන නිලධාරියාගේ සහතිකයකින් තොරව රු.534,720 ක මුදලක් ගෙවා තිබුණි. |
| (iii) මු.රෙ. 371 (2) (ඇ) | ගෙවීම් පියවීම සඳහා දෙන විශේෂ අත්තිකාරම් එය දෙන ලද කාර්ය නිමකල විගස පියවිය යුතු වුවත්, 2011 අප්‍රේල් වන විටත් රු. 751,568 ක අත්තිකාරම් ශේෂ නිරවුල් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2009 ජූනි 09 දිනැති ඩීඑම්ජී/2009(1) චක්‍රලේඛය හා 2010 නොවැම්බර් 30 දිනැති සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශ ලිපිය. | වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් වත් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුල පවත්වා තිබුනේ රැස්වීම් 01 ක් පමණි. |
| (ඇ) | 2010 මාර්තු 30 දිනැති අංක 34(11) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය. | මාසික වැටුප රු. 16,085 ක සිට රු. 21,284ක් දක්වා වූ නිලධාරීන්ට හිමි සංයුක්ත දීමනාව රු. 400 වුවත් එම චක්‍රලේඛයට පටහැනිව රු. 500 බැගින් ගෙවීම හේතු කොට ගෙන සමාලෝචිත වර්ෂයේ දී රු. 155,503 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
-----------------------------------

2.1 මූල්‍ය සමාලෝචනය
---------------------

2.1.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 6,376,395 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා ඌනතාවය රු. 1,732,297 ක වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු. 4,644,098 කින් පිරිහී තිබුණි. 2009 ජූනි මාසයේ සිට ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය යටතේ පැවති ශිල්පීය පුහුණු අංශය ජාතික ශල්ප සභාව වෙත පැවරීම නිසා මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන 2009 වසරට වඩා සමාලෝචිත වර්ෂය සඳහා රු.18,816,000කින් වැඩිකර තිබුණු අතර ඊට සාපේක්ෂව මුළු වියදම 2009 වසරට වඩා සමාලෝචිත වර්ෂයේ දී රු.22,912,928කින් වැඩි වී තිබීම මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට බලපා තිබුණි.

2.2 මෙහෙයුම් සමාලෝචනය

--------------------------

2.2.1 කාර්ය සාධනය

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) බත්තරමුල්ල ජාතික ශිල්ප ගම්මානයේ බීරළු හා රේන්ද ශිල්පීන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ සහ ලී කැටයම් ශිල්පීන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ එක් ගුරුවරියක් සහ එක් ගුරුවරයෙක් බැගින් සහ ලී කැටයම් ශිල්පීන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ එක් ශිෂ්‍යයෙක් ද විය. මේ අනුව මානව සම්පත් ඌන උපයෝජනයක් නිරීක්ෂණය විය.

(ආ) 2010 වර්ෂයට අදාලව වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර තිබුණද, එහි අරමුණු සපුරා ගැනීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. භෞතික ප්‍රගතිය සම්බන්ධයෙන් විෂයයන් 2ක කිසිදු තත්‍ය ප්‍රගතියක් නොවූ අතර විෂයයන් 2ක තත්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය 30% ට වඩා අඩු වී තිබුණි. එසේම මූල්‍ය ප්‍රගතිය සම්බන්ධයෙන් විෂයයන් 3ක තත්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය 30% ට වඩා අඩු වී තිබුණි.

2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සීගිරිය තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ ඉතිරි මුදල් රු.1,317,977 ක් වසර තුනක කාලයක සිට කිසිදු කාර්යයකට යොදා නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ ශිල්පීය පුහුණු අංශය 2009 මැයි 01 දින ජාතික ශිල්ප සභාවට පවරා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මානව සම්පත් හා ස්ථාවර වත්කම් නිසි පරිදි පවරා ගැනීමක් කර නොතිබුණි.

(ඇ) හස්ත කර්මාන්ත සඳහා දේශීය අමුද්‍රව්‍ය සුලභ කිරීම මගින් කර්මාන්ත කරුවන්ගේ නිෂ්පාදනය ඉහල නැංවීම හා ශිල්පීන් සඳහා විරල අමුද්‍රව්‍ය සැපයීම හා එම කටයුතු සංවිධානය කිරීම ජාතික ශිල්ප සභාවේ ප්‍රධාන අරමුණ වවද සභාව විසින් ශිල්පීන් වෙත රිදී පමණක් සපයා දීම සිදු කර තිබුණි.

(ඇ) සභාවේ 2010 වර්ෂයට අදාල අනුමත කාර්යය මණ්ඩලය නිලධාරීන් 88 ක් වූ අතර, විගණිත දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 58 ක් විය. පුරප්පාඩු 29 න් 24 ක් ම විධායක ශ්‍රේණියේ පුරප්පාඩු වන අතර, මෙම තනතුරු පුරප්පාඩු පුරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.3 හඳුනාගත් පාඩු

----------------

ගණකාධිකාරී වෙත වැඩිපුර ගෙවා තිබූ රු. 51,225 ක වැඩබැලීමේ දීමනාව, නිලධාරියා ජාතික ශිල්ප සභාවෙන් ඉවත්ව යාමේ දී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 අයවැය පාලනය

------------------

2010 වර්ෂය සඳහා අයවැය ලේඛණයක් පිළියෙල කර නොතිබීම හේතුවෙන් සත්‍ය අගයන් අයවැය ගත අගයන් සමඟ සැසදීමට නොහැකි විය.

3. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයා වෙත දන්වා යවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අත්තිකාරම් ගෙවීම් හා නිරවුල් කිරීම

(ආ) අයවැය පාලනය

(ඇ) අභ්‍යන්තර විගණනය

(ඈ) ගිණුම්කරණය

(ඉ) මානව සම්පත් කළමනාකරණය